# මාර්ගෝපදේශ: සුහුරුසර පාඨමාලා සම්පූර්ණ කිරීමේ ප්‍රතිලාභ වැඩසටහන

SuhuruSara
Your ICT Learning Hub

මාසික thyāga ඊ-තෑගි වවුචර් ප්‍රතිලාභ






## 1. වැඩසටහනේ අරමුණ



සිසුන් නියමිත කාලසීමාව තුළ තම පාඨමාලා සම්පූර්ණ කිරීමට සහ තම ඉගෙනුම් අත්දැකීම් බෙදා ගැනීමට උනන්දු කිරීම සඳහා, සුහුරුසර විසින් සෑම මාසයකම එක් ජයග්‍රාහකයෙකු තෝරාගෙන රු. 10,000 ක් වටිනා thyāga e-Gift Voucher එකක් ප්‍රදානය කරනු ලැබේ.

## 2. ත්‍යාග විස්තර




- ත්‍යාග වර්ගය: thyāga e-Gift Voucher
- වටිනාකම: රු. 10,000
- ත්‍යාග ප්‍රදානය කිරීමේ වාර ගණන: මාසිකව
- ජයග්‍රාහකයින් සංඛ්‍යාව: සෑම මාසයකම එක් ජයග්‍රාහකයෙක්

## 3. සුදුසුකම් ලැබීමේ නිර්ණායක

මාසික රු.10,000 ක thyāga e-Gift Voucher සඳහා සුදුසුකම් ලැබීමට, සිසුන් පහත සඳහන් සියලුම කොන්දේසි සපුරාලිය යුතුය.

- නියමිත කාලසීමාව තුළ පාඨමාලාව සම්පූර්ණ කිරීම
  - ශිෂ්‍යයා පාඨමාලාව සඳහා මුලින් ලබා දී ඇති නිල කාලසීමාව තුළම පාඨමාලාව සම්පූර්ණ කළ යුතුය.
  - අවසන් දින දීර්ඝ කිරීම් (deadline extensions) ලබාගෙන නොතිබිය යුතුය.
  - පැවරුම් හෝ ඇගයීම් නැවත ඉදිරිපත් කිරීමට (resubmissions) නොතිබිය යුතුය.

- සාර්ථකව පාඨමාලාව සම්පූර්ණ කිරීම
  - පාඨමාලාවේ සියලුම සම්පූර්ණ කිරීමේ අවශ්‍යතා සපුරාලිය යුතුය.
  - පාඨමාලාව සම්පූර්ණ කිරීමේ සහතිකය ලබාගෙන තිබිය යුතුය.

- සමාජ මාධ්‍යවල අත්දැකීම් (testimonial) වීඩියෝවක් පළ කිරීම
  - තම ඉගෙනුම් අත්දැකීම පිළිබඳ testimonial වීඩියෝවක් නිර්මාණය කර පළ කළ යුතුය.
  - එම වීඩියෝව පහත සඳහන් සමාජ මාධ්‍ය වේදිකාවලින් අවම වශයෙන් එකක පළ කළ යුතුය:
    - Instagram Page
    - Facebook Page
    - TikTok Account
  - Post කිරීමේදී සුහුරුසර නිල සමාජ මාධ්‍ය ගිණුම් tag කළ යුතුය.

- මුල් සහ මහජනතාවට දැකිය හැකි අන්තර්ගතය
  - Testimonial වීඩියෝව ශිෂ්‍යයා විසින්ම නිර්මාණය කළ මුල් අන්තර්ගතයක් විය යුතුය.
  - අනෙකුත් පරිශීලකයන්ට නැරඹිය හැකිවන පරිදි පළ කර තිබිය යුතුය.

## 4. ජයග්‍රාහකයා තෝරාගැනීමේ ක්‍රියාවලිය

සුදුසුකම් ලැබීමේ සියලුම නිර්ණායක සපුරාලන ශිෂ්‍යයන් එක් අයෙකුට වඩා සිටින අවස්ථාවකදී, සෑම මාසයකම එක් ජයග්‍රාහකයෙකු සුහුරුසර කළමනාකරණය විසින් තෝරාගනු ලැබේ. තෝරාගැනීම පහත කරුණු මත සිදු කළ හැකිය.

- Testimonial වීඩියෝවේ ගුණාත්මකභාවය සහ නිර්මාණශීලීත්වය, සහ/හෝ
- සුදුසුකම් ලැබූ සියලුම ශිෂ්‍යයන් අතරින් අහඹු තේරීමක් (Random Draw) මගින්

සුහුරුසර කළමනාකරණය විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

## 5. ජයග්‍රාහකයා ප්‍රකාශයට පත් කිරීම

The selected winner will be notified through:

- Email
- WhatsApp
- සුහුරුසර නිල සමාජ මාධ්‍ය පිටු (Facebook, Instagram, TikTok)

## 6. නියමයන් සහ කොන්දේසි

- ශිෂ්‍යයා විසින්ම නිර්මාණය කළ මුල් (Original) සහ මහජනතාවට දැකිය හැකි (Public) සමාජ මාධ්‍ය සටහන් සහ වීඩියෝ පමණක් පිළිගනු ලැබේ.
- Testimonial වීඩියෝ සහ ප්‍රතිචාර ගෞරවනීය, සත්‍ය සහ විශ්වාසදායක අන්තර්ගතයන් විය යුතුය.
- thyāga e-Gift Voucher එක වෙනත් අයෙකුට පැවරිය නොහැකි අතර මුදල් ලෙස හුවමාරු කළ නොහැක.
- මෙම වැඩසටහන ඕනෑම අවස්ථාවක සංශෝධනය කිරීමට හෝ නවතා දැමීමට සුහුරුසරට අයිතිය ඇත.

## 7. ප්‍රතිචාර සහ අත්දැකීම් ප්‍රකාශ භාවිත කිරීම සඳහා අවසරය

මෙම වැඩසටහනට සහභාගී වීමෙන්, ශිෂ්‍යයන් විසින් තම නම, ඡායාරූප සහ testimonial (අත්දැකීම් ප්‍රකාශ) ප්‍රචාරණ කටයුතු සඳහා සුහුරුසර විසින් භාවිත කිරීමට අවසර ලබා දේ.

## 8. වැඩිදුර විමසීම් සඳහා

- info@SuhuruSara.lk
- www.SuhuruSara.lk
- (+94) 76 296 4455